**පාසල් අධ්‍යාපන ක්‍රමය දැණුමේ කේන්ද්‍රයේ පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී) - පළාත් මට්ටම 2013**

**-------------------------------------------------------------------------------------------------------------------**

පාසල් අධ්‍යාපන ක්‍රමය දැණුමේ කේන්ද්‍රයේ පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ (ටීඑස්ඊපී) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජසංස) අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II (ආ)(3) ඡේදය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදල හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 ජූලි 18 එළඹි අංක ටීඑෆ් 013267 දරන ඕස්ට්‍රේලියානු ආධාර ගිවිසුමේ II(ආ)(3) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මූල්‍ය හා ආධාර ගිවිසුම් වලට අනුව අධ්‍යාපන අමාත්‍යාංශය (අධ්‍යා.අමා.) විසින් ව්‍යාපෘතියේ ජාතික මට්ටමේ කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය (පපහාපසඅ) සහ සියලුම පළාත් සභා (පස) විසින් පළාත් මට්ටමේ කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වේ. පපහාපසඅ හා පස විසින් පළාත් මට්ටමින් සිදුකල කාර්යයන් සම්බන්ධ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**---------------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ සක්‍යතා ලියවිල්ල අනුව, රටේ සමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රය මුහුණ දෙන අභියෝග දුරුකිරීමට 2012-2016 අධ්‍යාපන ක්ෂේත්‍ර සංවර්ධන කාර්යය රාමුවක් සහ වැඩසටහන් (ඊඑස්ඩීඑෆ්පී) ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහයෝගය ලබාදීම සඳහා ටීඑස්ඊපී ක්‍රියාත්මක කර ඇත. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය පදනම් වූ ආර්ථිකයක් සහ සමාජ සංවරධනය සඳහා අඩිතාලම සැපයීමට ප්‍රාතමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය හා ගුණාත්මක බව වැඩි කිරීමයි. මූල්‍ය හා ආධාර ගිවිසුම් වලට අනුව, රු. මිලියන 11,000 කට සමාන විගැහි මිලියන 64.1 ක (එජඩො මිලියන 100) ණය මුදලක් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබූ අතර ඕස්ට්‍රේලියානු භාර අරමුදල එජඩො 11,130,502 ක ආධාර සැපයීමට එකඟ වී තිබුණි. එයින් සියයට 70-80 පළාත් අධ්‍යාපන අධිකාරීන් සඳහා වෙන්කර තිබුණු අතර ඉතිරි සියයට 20-30 අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ඔක්තෝබර් 01 ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 නිම කිරීමට සැලසුම් කර තිබේ. ආධාර යටතේ සිදුකළ යුතු කාර්යයන් 2016 අප්‍රේල් 30 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**----------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

**---------------------------------------------**

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ සහ මෙහෙයුම් හා කළමනාකරණ සහය ඒකකයේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියදි පිළිබඳ තහවුරු

පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. පළාත් සභා නවයේ සහ මෙහෙයුම් හා කළමනාකරණ සහය ඒකකයේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදී. ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව, මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සහ ආධාර සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් සහ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය සහ ආධාර යටතේ ආපසු ගැනීම් මූල්‍ය සහ ආධාර ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය සහ ආධාර යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) මුදල් රෙගුලාසි 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 233/2013 ට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(ඊ) ආරම්භක හා අවසාන ශේෂ , අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(උ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඌ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 3. මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද පළාත් සභා නවයේ 2013 වර්ෂයේ විසර්ජන ගිණුම් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 සහ 2013 දෙසැම්බර් 06 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 233/2013 හි සඳහන් විධිවිධාන වලට අනුකූල වන පරිදි පිළියල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත, වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා පොත්, පළාත් සභා නවය නඩත්තු කරන ලේඛන හා වාර්තා සමඟ එකඟ වේ. 2013 වර්ෂයේ සඳහා ණය මුදල සහ ආධාරවලට බාහිරව ඇතිවන වියදම් පළාත් සභා නවයේ විසර්ජන ගිණුම්වල සහ මෙහෙයුම් හා කළමනාකරණ සහය ඒකකයේ නියමිත පරිදි වාර්තා වේ.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුම පළාත් සභා නවය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව සහ

(ඈ) මූල්‍ය හා ආධාර ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

---------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සහ ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘතියෙන් ලද ණය මුදල සහ ආධාර ඇතුලත් සියලු මූලාශ්‍රවලින් ලද අරමුදල් රු.1,385,000,000 ක අගයකින් සමාලෝචිත වර්ෂය තුල අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා දරණ ලද වියදම රු. 84,578,734,546 ක අගයක් විය. 2013 වර්ෂය සඳහා පළාත් සභා නවයේ විසර්ජන ගිණුම්වල දැක්වෙන ආකාරයට පළාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙහෙයුම් හා කළමනාකරණ සහය ඒකකයේ සියලු අරමුදල් මූලාශ්‍රවලින් දරන ලද වියදම්වල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| විස්තරය | 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුල සියලුම මූලාශ්‍රයන්ගෙන් ලද අරමුදල් වලින් දරන ලද වියදම |
|---|---|
| | Rs. |
| පුනරාවර්තන වියදම් : | |
| පෞද්ගලික පඩිනඩි | 76,888,995,912 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 3,637,852,298 |

| | |
|---|---|
| මුලධන වියදම් | 4,051,886,336 |
| | ------------------ |
| | 84,578,734,546 |
| | =========== |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

විගණනයට ලබා ගත හැකි වූ තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය තුල ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වාගෙන ගිය අංක 5696 අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | නැත | නැත |
| එකතුකළා :- ඌනපූර්ණයන් | 12,955,000 | 1,665,451,203 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 10,821,974 | 1,381,595,693 |
| විදේශ විනිමය අවාසිය | | 4,955,955 |
| | ------------- | --------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,133,026 | 278,899,555 |
| | ======= | ========= |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2012 ජුලි 31 දිනැති ජාත්‍යන්තර සංවර්ධන සංගමයේ ණය සහ ප්‍රධාන සඳහාවූ පොදු කොන්දේසි ප්‍රකාශනයෙහි 4.09 ඡේදය අනුව, මෙහෙයුම් ප්‍රමාණවත් ලෙස පෙන්නුම් කරන ආකාරයට ස්ථිරව භාවිතා කරන ගිණුම් ප්‍රමිතිවලට අනුකූලවූ මූල්‍ය ප්‍රකාශන, අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධ ව්‍යාපෘතියට අදාල සම්පත් සහ වියදම් ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වුවද, 2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභා නවය සහ මෙහෙයුම් සහ කළමනාකරණ සහය ඒකකය අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා සියළුම අරමුදල් මූලාශ්‍රයන්ගෙන් දරණ ලද මුළු වියදම වූ රු. 84,578,734,545 ක් නියෝජනය වන ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 06. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 6.1 අරමුදල් උපයෝජනය

පළාත් සභා නවයේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ වල මූලධන හා පුනරාවර්තන වියදම් දැරීම සඳහා සියළුම මූලාශ්‍රයන්ගෙන් එකතුව රු. 89,170,723,780 ක මුළු වෙන් කිරීමක් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන්කර තිබූ බව නිරීක්ෂණය විය. එයින් බස්නාහිර, වයඹ සහ සබරගමුව පළාත් වල පළාත් අධ්‍යාපන

අමාත්‍යාංශ වල වෙන් කිරීම් වලින් සියයට 5 ත් සියයට 16 ත් අතර පරාසයක එකතුව රු. 3,304,435,388 ක් වූ ඉතුරුම් 2013 දෙසැම්බර් 31 දිනට පැවැති බව වාර්තා විය. තවද, පළාත් සභා නවයේ මුළු වෙන්කිරීම් වලට මූල්‍යනය කිරීමට සහය වීම සඳහා රු.1,360,000,000 ක අගයක ණය මුදලක් සහ රු. 1,135,000,000 ක අගයක ආධාර සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදලෙන් ලැබී තිබුණි. කෙසේ වුවද, ඕස්ට්‍රේලියානු භාර අරමුදලෙන් ලැබී තිබූ සමස්ථ ප්‍රදානයම පළාත් සභා වල වියදම් නොකර පැවැතුණි. තව දුරටත් අනාවරණය වූ පරිදි ව්‍යාපෘතිය මඟින් සපයන ලද ණය සහ ප්‍රදාන එකතුව රු.374,509,805 ක් නියමිත කාර්යය සඳහා භාවිතා නොකර උතුරු හා නැගෙනහිර පළාත් සහා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ තැන්පතු ගිණුම් වල පැවැතුණි.

## 6.2 භෞතික ප්‍රගතිය

----------------

මෙම වාර්තාවේ 5.1 ඡේදයෙහි සඳහන් වන පරිදි 2013 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා පළාත් සභා විසින් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් හා කළමනාකරණ සහයක ඒකකය විසින් සියළුම අරමුදල් මූලාශ්‍රවලින් දරා තිබූ මුළු එකතු වියදම රු. 84,578,738,545 ක් නියෝජනය වන ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මෙහෙයුම් වලට අදාලව 2013 වර්ෂයේ පළාත් සභා විසර්ජන ගිණුම් මත සිදුකරන ලද ප්‍රධාන විගණන නිරීක්ෂණ කිහිපයක් පහත ආකාරයට නැවත ඉදිරිපත් කෙරේ.

(i). පළාත් මට්ටමේ පාසල් සඳහා ගුරුවරුන් වෙන් කිරීම සතුටුදායක ලෙස සිදුකර නොමැත. පළාත්වල දුෂ්කර ප්‍රදේශවල පාසල් ගුරු හිඟයක් සහිතව ක්‍රියාත්මක වූ අතර පළාත්වල නාගරික ප්‍රදේශවල පාසල් අනුමත කාර්ය මණ්ඩලයට වඩා ගුරු අතිරික්තයක් සහිතව ක්‍රියාත්මක වන බව වාර්තා විය. ලබාගත් තොරතුරු වලට අනුව, වාර්ෂික ගුරු මාරුවීම් ක්‍රමවත්ව ක්‍රියාත්මක නොකිරීම නිසා සබරගමුව, ඌව, බස්නාහිර, දකුණ හා නැගෙනහිර පළාත් වල ග්‍රාමීය පාසල්වල ප්‍රධාන විෂයන් සඳහා ගුරු හිගයක් පවතින අතර අදාල පළාත්වල නාගරික පාසල්වල ගුරු අතිරික්තයක් පවතී.

(ii). ලබාගත් තොරතුරු වලට අනුව, පළාත් කිහිපයකම ග්‍රාමීය ප්‍රදේශවල ප්‍රාථමික සහ ද්විතීක පාසල්වල වල ශිෂ්‍ය සංඛ්‍යාව අඩු මට්ටමක පවතී. දකුණු පළාතේ 500 ට අඩු ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින ද්විතීක මට්ටමේ පාසල් 827 ක් තිබෙන අතර මධ්‍යම පළාතේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට වඩා අඩු ප්‍රාථමික මට්ටමේ පාසල් 327 ක් තිබේ. සමාලෝචිත වර්ෂය තුළ වසා දැමූ පාසල් 2 ක් ඇතුලුව 2013 දෙසැම්බර් 31 දිනට දකුණු පළාතේ පාසල් 138 ක් වසා දමා තිබෙන බව වාර්තා විය.

(iii). මධ්‍යම පළාතේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 6.82 ක් වන අතර අනෙකුත් පළාත්වල සමත්වීමේ ශිෂ්‍ය අනුපාතය සියයට 9.5 සිට 11.5 දක්වා පරාසයක පවතී. බස්නාහිර,සබරගමුව,ඌව,උතුරු මැද පළාත්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සියළු විෂයන් අසමත් වීමේ අනුපාතය සියයට 4 සිට සියයට 8 දක්වා පරාසයක ඉහළ අගයක පවතී. තවද, වයඹ, දකුණ, මධ්‍යම, උතුරුමැද සහ බස්නාහිර පළාත්වල අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ සියලු විෂයන් අසමත් වීමේ අනුපාතය සියයට 10 සිට 16 දක්වා ඉහළ පරාසයක පැවැතුණි.

(iv). ඌව හා උතුරු මැද පළාතේ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල මෙහෙයුම්වල ප්‍රගතිය එම අදාල දෙපාර්තමේන්තුවල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම, කාර්යය සාධන සමාලෝචන වාර්තා වල අඩු බව නිසා විගණනයේදී සත්‍ය ලෙස තක්සේරු කිරීමට නොහැකි විය. තවද, 2013 දෙසැම්බර් 31 දිනට නැගෙනහිර පළාත් සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය ක්‍රියාත්මක නොවන බව වාර්තා විය. අදාල

පළාත් සභාවල අධ්‍යාපන අමාත්‍යාංශවල කාර්යය සාධනය සමාලෝචනය කළ හැකි වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නැගෙනහිර හා උතුරු මැද පළාත්වල පවත්වා නොතිබුණි.

(v). දකුණු, උතුරු මැද හා ඌව පළාත්වල අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ 2013 වාර්ෂයේ පවත්වා නොතිබුණි.

(vi). බස්නාහිර, නැගෙනහිර, උතුරු මැද පළාත් වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවලට අයත් මෝටර් වාහන, පරිගණක හා අනිකුත් උපකරණ, ගුරු නිවාස ආදී වත්කම් කිහිප අවස්ථාවකම අයුතු අත්තිකාරම් ගැනීම් හෝ ප්‍රයෝජනයට යොදා නොගැනීම් හෝ තිබු බව වාර්තා විය.

(vii). සබරගමුව, බස්නාහිර, දකුණු පළාත්වල පළාත් මට්ටමේ පාසල්වල තහවුරු කිරීමේ ලේඛන නොමැතිව හෝ විධිමත් අධිකාරි බලයක් නොමැති ගෙවීම් කිරීම, බැංකු සැසඳුම් විස්තර පිළියෙල කිරීමේ අඩුපාඩු, අත්තිකාරම් දීර්ඝ කාලයක් පියවා නොතිබීම වැනි මූල්‍ය පාලනයේ දුර්වලතා කාර්ය සාධන විගණනයේදී වාර්තා විය. තවද, මානව සම්පත් කළමනාකරණය, ගුරුවරුන්ගේ නිවාඩු හා ගුණාත්මක යෙදවුම් සඳහා සුදුසු වාර්තා පවත්වා ගෙනයාම, ශිෂයන්ගේ ශිෂ්‍යාත්ව වැඩසටහන යටතේ රජයේ ආධාර බෙදාහැරීම සහ ගුරුවරුන්ගෙන් අපදා හා අනිකුත් ණය, නිවාස කුලී වැනි මාසික අඩු කිරීම් යන ක්ෂේත්‍රයන්හි අදාල පළාත් පාසල්වල සාමාන්‍ය පරිපාලන කටයුතු බස්නාහිර, නැගෙනහිර, සබරගමුව, උතුරු මැද හා වයඹ පළාත්වල පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී නිරීක්ෂණය විය.